දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු
First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

# ආවිප්‍ර 1.2 - ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
# EC 1.2 – History of Economics Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න.

---

01. (i) නව වන (09) සියවසේ සිට පහළොස් (15) වන සියවස දක්වා බටහිර යුරෝපයේ ක්‍රියාත්මක වූ වැඩවසම් සමාජයේ හඳුනා ගත හැකි පොදු ලක්ෂණ කවරේ ද?
(ලකුණු 10 යි)

(ii) දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වැඩවසම් ක්‍රමය විග්‍රහ කළ හැක්කේ කෙසේ ද?
(ලකුණු 10 යි)

02. (i) ප්‍රංශ ආර්ථික හා දේශපාලන පීඩනය ප්‍රංශ විප්ලවයකට හේතු වූ ආකාරය සනාථ කිරීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කරන්න.
(ලකුණු 10 යි)

(ii) විශාල බලවේගයක් ලෙස ක්‍රියාත්මක වූ ප්‍රංශ විප්ලවය අනාගත ලෝක දේශපාලන ක්ෂේත්‍රයට විශාල අත්දැකීම් හා ආදර්ශයන් රැසක් සලසාදීමට සමත් වූ ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

03. (i) මහා බ්‍රිතාන්‍යයේ කෘෂිකාර්මික විප්ලවය කාර්මික විප්ලවය පෝෂණය කරන ලද ප්‍රධාන මෙවලමක් වූයේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

(ii) කෘෂිකාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් සුළු ඉඩම් හිමියන්ගේ අතුරුදහන්වීම පැහැදිලි කරනුයේ කෙසේ ද?
(ලකුණු 10 යි)

04. (i) ප්‍රංශය, ජර්මනිය, රුසියාව සහ මහා බ්‍රිතාන්‍යය යන රටවල දුම්රිය ගමනාගමනය ආරම්භවීම මෙම රටවල කාර්මික විප්ලවය පෝෂණය කිරීමට දායක වූ ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

(ii) දහ නව වැනි (19) සියවසේ රුසියාවේ කෘෂි කාර්මික සංවර්ධනය පිළිබඳ පුළුල් විග්‍රහයක යෙදෙන්න.
(ලකුණු 10 යි)

05. (i) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ කෝල්බෲක් - කැමරන් කොමිසම පත් කිරීම සඳහා හේතු සාධක වූ පසුබිම සාකච්ඡා කරන්න.

(ලකුණු 08 යි)

(ii) ලිබරල්වාදී ගුණාංග පදනම් වූ පෞද්ගලික ව්‍යවසාය ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ නිර්දේශිත ආර්ථික යෝජනා පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 06 යි)

(iii) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම මගින් ශ්‍රී ලංකාවේ නිදහස් ශ්‍රම වෙළෙඳපොලක් නිර්මාණය කර ගැනීමට බ්‍රිතාන්‍ය පාලනය යටතේ ගනු ලැබූ ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වූයේ ද? හේතු දක්වන්න.

(ලකුණු 06 යි)

06. (i) 1840 ගණන්වල මැද භාගයෙන් පසු පස් අවුරුදු කාලය තුළ ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ පරිහානිය සඳහා බලපානු ලැබූ සාධක පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 10 යි)

(ii) 1880 ගණන්වලින් පසුව ශ්‍රී ලංකාවේ තේ වගාවේ සීඝ්‍ර වර්ධනයට ඉවහල් වූ සාධක පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 10 යි)

07. (i) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක පසුබිම පහත ක්ෂේත්‍ර ඔස්සේ විමර්ශනය කරන්න.

(අ) ස්වභාවික වර්ධනය

(ආ) ශුද්ධ සංක්‍රමණය

(ලකුණු 10 යි)

(ii) "1812 වර්ෂය ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන ප්‍රතිපත්තිය නව යුගයක් සනිටුහන් කළ වර්ෂයකි." ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෘජු ආයෝජන ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියේ දක්නට ලැබුණ සුවිශේෂී ලක්ෂණ ගෙන හැර දක්වමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

08. පහත දී ඇති ඕනෑම දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ රාජකාරි ක්‍රමය
ii. 1882 - 1895 'නව භෝග යුගය'
iii. ශ්‍රී ලංකාවේ දස අවුරුදු සැලැස්ම

(ලකුණු 20 යි)